# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාල සහතික පත්‍රවල පිටපත් ද සමගින්, 2026.06.29 දිනට හෝ ඊට පෙර ආයතනය වෙත ලැබෙන සේ **"ජ්‍යෙෂ්ඨ සහකාර රෙජිස්ට්‍රාර් / ආයතන සහ පොදු පරිපාලන, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යායතනය, අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ recruitment@pgim.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්කරුවන් තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් ලිපියේ විෂය පථයෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍ර සහ වැඩිදුර විස්තර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නිල වෙබ් අඩවියෙන් (https://pgim.cmb.ac.lk) ලබා ගත හැක. සලකා බලනු ලබන්නේ නියමිත ආකෘති පත්‍රයට අනුව ඉදිරිපත් කරන අයදුම්පත් පමණි.

අසම්පූර්ණ හෝ සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කරන සහතිකයන්හි සහතිකකල ඡායා පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාර නොගන්නා අතර, ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කිසිදුහේතුවක් මත නැවත සලකා බලනු නොලැබේ.

## 01. රියදුරු තනතුර (III ශ්‍රේණිය) - තනතුරු 01

**සුදුසුකම් :**

01. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් උපරිම වාර දෙකකදී, අවම වශයෙන් සම්මාන සාමාර්ථ (02) ක් සහිතව විෂයන් හයකින් (06) සමත් වී තිබීම

**සහ**

02. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ බලපත්‍රය ලබාතිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක(03) රිය පැදවීමේ පළපුරුද්දක් තිබීම.

**වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වෙනත්** : සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරේ වගකීම් මැනවින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ සදාචාරාත්මක චරිතයකින් හෙබි විය යුතුය.

**තේරීමේ ක්‍රමය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ වෘත්තීය පරීක්ෂණයක් (Trade Test) මගින්

**වැටුප් පරිමාණය** : 2025.01.01 දිනට මසකට රු. 48,005 - 16x490 - 55,845 [U PL 3(III)]

**අධ්‍යක්ෂ,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
**2026.06.07**